රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

පළාත් සභා සහ පළාත් පාලන අංශය
330, යූනියන් පෙදෙස, කොළඹ 02.
மாகாணசபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரிவு
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.
Provincial Councils and Local Government Division
330, Union Place, Colombo 02.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2305326
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2329725
ඊ-මේල් / மின்னஞ்சல் / Email: secretary@pclg.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: https://mpclg.gov.lk/

මගේ අංකය / எனது இல / My No: PL/15/MSW/Guidelines/01-2025
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.01.30

නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ අංක 01/2025

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

**<u>පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කරමින්, චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහි ලා එම ආයතන සතු වගකීම ඉටු කිරීම</u>**

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි සඳහන් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශවලට අනුව පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කරමින් චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහි ලා සියලුම පළාත් පාලන ආයතන සතු වගකීම ඉටු කිරීමේ අරමුණෙන් යුතුව ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින් අංක: PA/PCLG-35/107/2024 හා 2024.12.16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා අනුව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2024.12.23 දිනැතිව අනුමැතිය ලබා දී ඇත.

02. ඒ අනුව, තිරසර නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් උදෙසා ප්‍රජා සහභාගිත්වය මෙන් ම ප්‍රජා දැනුම්වත්භාවයෙහි ඇති වැදගත්කම හඳුනා ගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සියලු ම පුරවැසියන් හා පළාත් පාලන ආයතනවලට ඇති වගකීම හා බැඳීම තහවුරු කරමින්, ඔවුන් සවිබලගන්වමින් පළාත් පාලන ආයතන බලප්‍රදේශ තුළ ප්‍රජාව හා ආයතන අතර ශක්තිමත් සබඳතා ගොඩ නංවමින් ප්‍රජා සහභාගිත්වයෙන් එක් එක් බලප්‍රදේශ සඳහා සුදුසු අනන්‍ය ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම පළාත් පාලන ආයතන පහත පරිදි ක්‍රියාත්මක විය යුතු වේ.

## 2.1 <u>නෛතික පසුබිම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ඔක්තෝම්බර් 01 වන දින අනුමත කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ප්‍රජාවගේ අනිවාර්ය මැදිහත්වීමේ වැදගත්කම සම්බන්ධයෙන්

අවධානය යොමු කරමින් එම ප්‍රතිපත්තියෙහි 8.2.1හි අනු අංක 1 වශයෙන් නාගරික ඝන අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපත්තියත්, ඒ සඳහා ප්‍රජා සහභාගිත්වය තහවුරු කිරීම සඳහා වූ ප්‍රතිපත්ති කෙරෙහිත් අවධානය යොමු කළ යුතුය. ඒවා නම්;

(අ) ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ සහිතව ඵලදායීව හා කාර්යක්ෂමව නාගරික ඝන අපද්‍රව්‍ය විධිමත්ව එක්රැස් කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් නිවාස, ආයතන සහ අනෙකුත් වාණිජ අස්ථිත්වයන්ගේ සක්‍රීය සහභාගිත්වය ලබා ගැනීම.

(ආ) පළාත් පාලන ආයතන විසින් ප්‍රජා සහභාගිත්වය සහිතව අපද්‍රව්‍ය එකතු කිරීමේ කාල සටහන් සකස් කිරීම සහ යම් හෙයකින් කාලයෙහි වෙනසක් හෝ ප්‍රමාදයක් සිදු වන්නේ නම් අපද්‍රව්‍ය තැනින් තැන දැමීම හෝ අවිධිමත්ව බැහැර කිරීම වැළැක්වීම පිණිස ඩිජිටල් තාක්ෂණය හෝ වෙනත් භාවිතයට පහසු ක්‍රමවේදයක් භාවිතා කරමින් ඒ බැව් කල් ඇතිව ප්‍රජාවට දැනුම් දීම.

(ඇ) පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය ජනනය වීම වැළැක්වීම සඳහාත්, හැකිතාක් දුරට ගෘහස්ථ කසළවල උපයෝග්‍යතා වටිනාකම ඉහළ නැංවීමෙහිලා පහසුකම් සැපයීම පිණිස, සුදුසු ප්‍රභවයේ දී වෙන් කිරීම හා තවදුරටත් වෙන් කිරීම මඟින් ප්‍රභවයේ දීම අපද්‍රව්‍ය අවම කිරීම සඳහා උපායමාර්ග සකස් කිරීම.

2.1.1 ඉහත ප්‍රතිපත්ති ප්‍රකාශවලට අමතර වශයෙන් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි 8.5.4 යටතේ පුරවැසියන්, සිවිල් සංවිධාන, ප්‍රජා සංවිධාන සහ ප්‍රජා නියෝජිතයන්ගේ දායකත්වය සහ තෘප්තිය යටතේ පහත ප්‍රතිපත්ති ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම හඳුන්වා දී ඇත.

(අ) "ප්‍රීතිමත් පවුල" යන්න කේන්ද්‍ර කර ගනිමින් ගෘහස්ථ මට්ටමෙන් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවලට සක්‍රීයව දායක වීම කෙරෙහි ප්‍රජා කණ්ඩායම් අභිප්‍රේරණය කිරීම.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණයෙහිලා ප්‍රජා දායකත්වයේ ධනාත්මක ප්‍රතිඵල සහ කාලීනව ක්‍රියාමාර්ග නොගැනීමේ ඍණාත්මක බලපෑම් සම්බන්ධයෙන් සහ ප්‍රජා කණ්ඩායම්වල නවෝත්පාදන, නිර්මාණශීලී අදහස් මෙන්ම අදහස් හුවමාරු කර ගැනීම් ඔවුනොවුන් අතර ප්‍රවර්ධනය කිරීම.

(ඇ) පද්ධති වැඩිදියුණු කිරීම් තවදුරටත් දිරිමත් කිරීම සඳහා, අපද්‍රව්‍ය කළමනාකරණයෙහි කාර්යසාධනය සම්බන්ධව ධනාත්මක මෙන්ම ඍණාත්මක ප්‍රතිඵල හා බලපෑම්, ජාතික හා ප්‍රාදේශීය මට්ටම්වල දී ඒවායෙහි ප්‍රතිඵලය ධනාත්මක හා ඍණාත්මක දාම ප්‍රතික්‍රියා සහිතව, පුරවැසි උපදේශන සාකච්ඡා ප්‍රවර්ධනය සහ වාර්ෂිකව පුරවැසි වාර්තා සැකසීමට ක්‍රියාමාර්ග ගැනීම.

අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් පාලන ආයතන විසින් මළ අපද්‍රව්‍ය ඇතුලුව නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමේ දී ඒ ඒ ආයතන

සමඟ සහයෝගිත්වයෙන් යුතුව ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ප්‍රාදේශීය මට්ටමේ දී අපද්‍රව්‍ය කළමනාකරණ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම, අපද්‍රව්‍ය ගබඩා කිරීම, පිරියම් කිරීම සහ බැහැර කිරීම සඳහා ඉඩම් වැනි යටිතල පහසුකම් සැපයීම, මහජනතාවගේ සහයෝගයෙන් ප්‍රදේශයේ පවිත්‍රතාව පවත්වා ගැනීම, පාරිසරික ගැටලු සහ මහජන පීඩා ඇති වන පරිදි කිසිදු අපද්‍රව්‍යයක් අවිධිමත්ව බැහැර නොකරන බවට සහතික වීම, තම ප්‍රදේශවල පුරවැසි සහභාගිත්වය උපරිම කිරීම සහ කසළ ජනනය අවම කිරීම පිණිස දිරිගැන්වීම් ක්‍රම හඳුන්වා දීම, කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපෝෂණ ප්‍රවේශය සහිතව බලධාරීන්ට හා මහජනතාවට වාරිකව ප්‍රගතිය වාර්තා කිරීම අනිවාර්යය වේ.

## 2.2 ඉලක්කගත අරමුණු

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ මූලික අරමුණු ද්විත්වය වන සනීපාරක්ෂාව සහ පාරිසරික ආරක්ෂණය තහවුරු කිරීමට වගබලා ගැනීම සඳහා පහත සඳහන් ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීමට සියලුම පළාත් පාලන ආයතන කටයුතු කළ යුතු වේ.

2.2.1 අපද්‍රව්‍ය ජනනය කරන්නන් වශයෙන් සමස්ථ ප්‍රජාව සහ ඊට ඔවුන්ගේ ඇති සම්බන්ධතාවයෙහි ප්‍රමාණය මත, අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්වල නිරතවීම සඳහා සියලුම පුරවැසියන් සහ පළාත් පාලන ආයතන නෛතිකව වගකිව යුතු බවට පත් කිරීම.

2.2.2 අනුගතවීමෙන් ඔබ්බට ගොස් අපද්‍රව්‍ය ජනනය වීම වළක්වාලමින් සහ අවම කරමින් තනි තනිව සහ සාමූහිකව අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා වගවීමෙහි සහ වගකීමෙහි අවශ්‍යතාව පිළිබඳව පුරවැසියන්ගේ සහ පළාත් පාලන ආයතනවල සංවේදීතාව ඉහළ නැංවීම මඟින් ආකල්පමය පරිවර්ථනයකට මුල පිරීම.

2.2.3 විනිවිදභාවයකින් යුතු ආචාර සම්පන්න විධි ක්‍රම අනුගමනය කරමින් පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කාර්යභාරයේ මහජන විශ්වාසය ගොඩ නැංවීම.

2.2.4 ඉදිරි වසර 03 තුළ අවසන් බැහැර කිරීම සඳහා යොමු වන කසළ ප්‍රමාණය 30%කින් අවම කිරීම යන රජයේ ප්‍රතිපත්තියට අනුව අවශ්‍ය පෙලගැස්වීම් සිදු කර, සුදුසු ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

2.2.5 පළාත් පාලන බල ප්‍රදේශ සඳහා සුදුසු අනන්‍ය ක්‍රියාකාරකම්/ ව්‍යාපෘති හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම සඳහා පළාත් පාලන ආයතන සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් සනීපාරක්ෂාව සහ පාරිසරික ආරක්ෂණය තහවුරු කිරීමේ තිරසර වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම.

## 2.3 ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල

කසළ කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණෙන් පළාත් පාලන ආයතන, ප්‍රජාව සහ හඳුනාගත් කණ්ඩායම් සමඟ කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සලසා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒවා නම්;

I. ප්‍රජා මූල සංවිධාන සමඟ හවුල්කාරිත්වය

බිම් මට්ටමෙන් අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා මූල සංවිධාන වටිනා ගමන් සගයන් බවට පත් කර ගැනීම. මෙම හවුල්කාරිත්වය මඟින් අපද්‍රව්‍ය කළමනාකරණයේ දී ක්‍රියාකාරීව සහභාගී වීමට ප්‍රජාව බලගන්වනු ලබන අතරම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ස්වේච්ඡා විශේෂඥ සහය භාවිතා වීම මඟින් දේශීය විශේෂඥ දැනුම උපයෝගී කර ගෙන ප්‍රජා සහභාගිත්වය තවදුරටත් ශක්තිමත් වීම අරමුණු කර ගනී.

II. කාන්තා ප්‍රජා මූල සංවිධාන

ගෘහස්ථ හා ප්‍රජා අපද්‍රව්‍ය කළමනාකරණයේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබන තීරණාත්මක ජන විකාශයක් හරහා අපද්‍රව්‍ය අවම කිරීමේ පණිවිඩය පැතිරවීම මඟින් ක්ෂණිකව විශාල ජන සමූහයක් සහ වපසරියක් ආවරණය කිරීම.

III. යෞවන කණ්ඩායම්

තරුණ කණ්ඩායම් හවුල් කර ගැනීමෙන් තරුණ පරම්පරාවේ ශක්තිය හා නවෝත්පාදන හැකියාව සහ චින්තනය තුළින් පරිසර හිතකාමී භාවිතා ප්‍රවර්ධනය කිරීමට ඔවුනගේ හැකියාව උපයෝගී කර ගැනීම.

IV. පාසැල් සිසුන්

ගෘහස්ථ කොම්පෝස්ට් නිෂ්පාදනයේ වැදගත්කම සහ ප්ලාස්ටික්, පොලිතින් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයේ ප්‍රවර්ධනයට පාසල් මට්ටමින් ක්‍රියාත්මක වීම.

V. සමෘද්ධිලාභීන්, අස්වැසුමලාභීන්, ආබාධිත ප්‍රජාව

සියලු ජන කොටස් නියෝජනය කරමින් ප්‍රජාව වෙත විධිමත්ව පණිවිඩය සන්නිවේදනය කිරීමටත්, එම ප්‍රජාවන්ගේ අනිවාර්යය සහභාගිත්වය තුළින් වැඩසටහන සක්‍රීය කිරීමත් අරමුණු වේ.

VI. අවිධිමත් අංශයේ අපද්‍රව්‍ය එකතු කරන්නන්

සුවිශේෂී කණ්ඩායම්වල සහභාගිත්වය තහවුරු කිරීම තුළින් සියලු අංශ ආවරණය වන විධිමත් වැඩපිළිවෙලක් සකස් වීම.

## 2.4 ක්‍රියාකාරකම්

ප්‍රජා සංවිධාන, විවිධ කණ්ඩායම් සහ ආයතනවල සහයෝගය ලබා ගනිමින් පළාත් පාලන ආයතන විසින් රැස් කරනු ලබන කසළ ආරම්භක ප්‍රභවයේදී ම නිසි පරිදි වෙන් කර ලබා දීම සම්බන්ධයෙන් සමස්ථ පුරවැසියන්ගේ දැනුවත්භාවය ඉහළ නංවාගෙන ප්‍රතිචක්‍රීකරණය වෙත නැඹුරු කරවීම තුළින් ජනනය වන කසළ ප්‍රමාණය අවම කිරීමට කටයුතු කළ යුතුය. මේ සඳහා එක් එක් පළාත් පාලන ආයතන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ තම පළාත් පාලන ආයතනයට ගැළපෙන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර තම පළාත් පාලන ආයතන බලප්‍රදේශයට ගැළපෙන පරිදි පහත ක්‍රියාකාරකම් අනුව තම ප්‍රදේශයට අනන්‍ය වූ තොරතුරු රැස් කරගෙන එම තොරතුරු මත පදනම්ව සවිස්තර ක්‍රියාකාරී සැලැස්මක් සකස් විය යුතු වේ.

I. පුරවැසියන්/ පුරවැසි සංවිධාන සමඟ උපදේශන අවස්ථා

කසළ කළමනාකරණ ගැටළු පිළිබඳ අදහස් හා ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාව සහ පුරවැසි සංවිධාන සමඟ පළාත් පාලන ආයතන ක්‍රියාකාරීව සම්බන්ධ වී මූලික අදහස් හා යෝජනා ලබා ගැනීම සහ මහජන සමීක්ෂණ, ප්‍රජා රැස්වීම් මඟින් වැසියන්ගේ අපේක්ෂා, අදහස් සහ යෝජනා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම. (ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ සහය උපරිමව ලබා ගැනීමෙන් මෙම ඉලක්කය සපුරා ගත හැක).

II. පෞද්ගලික අංශය සමඟ උපදේශන සාකච්ඡා

අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල නියුතු සමාගම් සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපාර ඇතුලු පෞද්ගලික අංශය සමඟ සහයෝගිතාවය වර්ධනය කර ගනිමින් කසළ කළමනාකරණ කටයුතු සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම.

III. ප්‍රජා සංවිධාන, කමිටු සහ කණ්ඩායම් සංස්ථාපනය

හඳුනා ගන්නා ලද ඉලක්කගත කණ්ඩායම්/ ප්‍රජා මණ්ඩල/ ග්‍රාමීය කමිටු හෝ ග්‍රාමීය සමිති අලුතෙන් පිහිටුවීම හෝ පවතින කමිටු/ ප්‍රජා මණ්ඩල හෝ සමිති නැවත සක්‍රීය කිරීම සහ එම පිරිස් මෙම කාර්යභාරයේ සක්‍රීය දායකත්ව සපයන්නන් පිරිසක් බවට පත් කර ගැනීම.

IV. ක්ෂණික අවධානය යොමු විය යුතු අවස්ථා

ප්‍රජාවගේ සහයෝගය, ප්‍රජා මණ්ඩල සහ ග්‍රාමීය කමිටුවල සහයෝගය ලබාගනිමින් බලප්‍රදේශයේ අවිධිමත් ලෙස කසළ බැහැර කරන ස්ථාන හඳුනාගෙන සිතියම්ගත කිරීම සහ එම අවිධිමත් කසළ බැහැර කිරීමේ ස්ථාන පුනරුත්ථාපනයට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමත්, පරිසර පොලිසිය දැනුවත් කරමින් තවදුරටත් කසළ බැහැරවීම වැළැක්වීමට අවශ්‍ය පිළියම් යෙදීම.

V. කසළ රැස් කිරීමේ විධි විධික්‍රම

කසළ බඳුන් අධීක්ෂණය, වෙන් කරන ලද කසළ එකතු කිරීම, වීදි හා ගෘහස්ථ කසළ එකතු කිරීමේ දී බලප්‍රදේශය ආවරණය වන සැලසුමක් සකස් කිරීම හා ඒ අනුව ප්‍රජාව දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දී විධිමත්ව කසළ එකතු කිරීම.

VI. කසළ බැහැර කිරීම සහ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය

(අ). ගෘහස්ථව කොම්පෝස්ට් නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා ප්‍රජාව සමඟ සම්බන්ධ වීමත්, එමඟින් ගෘහස්ථව ජනනය වන අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ප්‍රජාව පෙළඹවීම.

(ආ). කොම්පෝස්ට්වලින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මඟින් කොම්පෝස්ට්වල ප්‍රතිලාභ සහ ගෙවතු වගා ප්‍රවර්ධනයත්, කෘෂිකර්මාන්තයේ දී කොම්පෝස්ට් භාවිතය දිරිමත් කිරීම.

(ඇ). Whatsapp groups, Tik tok, යූ ටියුබ් හරහා තරුණ සහභාගිත්වය තුළින් කොම්පෝස්ට් භාවිතය ප්‍රවර්ධනය කිරීම හරහා නාගරික සහ ග්‍රාමීය ගෙවතු වගා ප්‍රවර්ධනය.

VIII. පුරවැසි සහභාගිත්වය සහිත ජාල ක්‍රියාකාරී කිරීම.

පුරවැසි සහභාගිත්වය සමඟ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු විධිමත් කිරීම සඳහා ස්වේච්ඡා සේවක ජාල, සිවිල් සමාජ ජාල සහ කොට්ඨාශ මට්ටමෙන් කමිටු පිහිටුවීම ආදී වශයෙන් වූ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජා කමිටු, ස්වේච්ඡා සංවිධාන, පෞද්ගලික ආයතන, වෙළඳ සංගම් ඇතුලු ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් පිරිසිදු කිරීමේ/ ප්‍රතිසංස්කරණය කිරීමේ දිනයක්/ සතියක් ප්‍රකාශයට පත් කරමින්;

(අ). නිවාස වටපිටාව, මුඩු ඉඩම්, වැඩ බිම්, ආයතනික පරිශ්‍ර ඇතුලු අවට පරිසරය පිරිසිදු කරමින් මදුරුවන් ඇතුලු රෝගවාහකයන් බෝ වීමට අවකාශ ඇති කාණු, බෝක්කු වැනි ස්ථානවල අවහිරතා ඉවත් කර ජලය බැස යාමට සැලැස්වීම.

(ආ). නගරයේ මාර්ග දෙපස, පොදු වැසිකිළි, ඇළ මාර්ග සහ කාණු පද්ධති පිරිසිදු කිරීම මඟින් නගරයේ අලංකාරය හා පිරිසිදුබව රැකෙන ක්‍රියාකාරකම් සිදු කිරීම.

(ඇ). පොදු වැසිකිළි, කාණු පද්ධති, මාර්ග ආදී පිළිසකර/ ප්‍රතිසංස්කරණය කළ යුතු අංශ හඳුනාගෙන ප්‍රමුඛතාගත ලේඛනයක් සකස් කිරීම හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයෙන් හැකි තරම් එම අලුත්වැඩියා කටයුතු අවම පිරිවැයකින් නිම කර, මහජන පීඩා ඇති නොවන පරිදි කටයුතු කිරීම.

(ඇ). කසළ පොළක් පැවැත්වීම මගින් අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීමත්, අමතර ආදායමක් පළාත් පාලන ආයතනයට ලබා ගැනීමටත් කටයුතු කිරීම.

(ඉ). ප්‍රජාවගේ වගකීම හා වගවීම සම්බන්ධයෙන් නිරන්තර දැනුවත් කිරීම් සඳහා මාධ්‍ය ප්‍රචාර සහ දැනුවත් කිරීම් සිදු කිරීම.

(ඊ). මහජන පැමිණිලි ලබා ගැනීමේ යාන්ත්‍රණයක් සහ ඒ අනුව පළාත් පාලන ආයතනය ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ ක්‍රමවේද සකස් කිරීම (විශේෂයෙන්ම කසළ සම්බන්ධව)

(උ). පොලිතින් භාවිතය අවම කිරීමේ නිර්මාණාත්මක දිරි ගැන්වීම් ප්‍රචලිත කිරීම හා ඒවා මිලදී ගැනීමේ පහසුකම් අවස්ථා ඇති කිරීම.

(ඌ).නගර අලංකරණය සඳහා විධිමත් සැලැස්මකට අනුව රුක් රෝපණය කිරීමටත්, මල් ගොමු ඇති කිරීමටත් සුදුසු ස්ථාන හඳුනාගෙන ඒවා ඉදි කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රජාව සහ පෞද්ගලික අංශ සම්බන්ධ කර ගැනීම.

03. ඉහත මගපෙන්වීම අනුව, පළාත් පාලන ආයතන ස්වකීය බලප්‍රදේශවලට ගැළපෙන පරිදි එම ප්‍රදේශයේ දෛනිකව ජනනය වන කසළ ප්‍රමාණය පිළිබඳව නිවැරදි තක්සේරුවක් මත එහි ඉදිරි විකාශය අනුව ගළපමින් එක් එක් පළාත් පාලන ආයතන බලප්‍රදේශයට අනන්‍ය වූ විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ගැනීමටත්, එම සැලැස්ම තුළ ප්‍රජාව, පරිසර පොලිසිය, පෞද්ගලික අංශය, පාසැල් සිසුන්, යෞවන කණ්ඩායම්, අස්වැසුමලාභීන්, ආබාධිත ප්‍රජාව, සමෘද්ධිලාභීන් සහ අවිධිමත් අංශයේ අපද්‍රව්‍ය එකතුකරන්නන් අනිවාර්යය සාමාජිකයින් බවට පත් කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

04. පළාත් පාලන ආයතනයේ එලෙස සකස් කරනු ලබන කසළ කළමනාකරණ සැලැස්ම අනුව විධිමත් පසුවිපරම් සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කරමින් නියම කර ගනු ලබන කාලසටහනක් අනුව රැස්වීම් පවත්වමින් අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට වගබලා ගත යුතු අතරම එම අවස්ථා පළාත් පාලන කොමසාරිස් හා සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණයට සහ මගපෙන්වීමට යටත් විය යුතුය.

05. සියලුම පළාත් පාලන ආයතන ඉහත උපදෙස් හා මගපෙන්වීම් අනුව යමින් ස්වකීය කසළ කළමනාකරණ සැලැස්ම සකස් කරගෙන ඒ අනුව හඳුනාගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම **2025.02.01** දින සිට ආරම්භ කළ යුතු අතර වැඩසටහනේ ප්‍රගතිය ඇමුණුම 01 ආකෘති පත්‍රය අනුව සකස් කර මාසිකව දිස්ත්‍රික් භාර සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් මඟින් පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු වේ. පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් එම මාසික ප්‍රගතිය අනුව ත්‍රෛයිමාසිකව ඇමුණුම 02 පරිදි සකස් කරනු ලබන වාර්තාවක් ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහයක මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය

06. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ ප්‍රධාන අරමුණු ද්විත්වය වන සනීපාරක්ෂාව සහ පාරිසරික ආරක්ෂණය තහවුරු කිරීම සඳහා ඉහත ලබාදුන් උපදෙස් ප්‍රකාරව ඔබ පළාත තුළ සියලුම පළාත් පාලන ආයතන ආවරණය කරමින් සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් පළාත් පාලන කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් භාර සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් සහ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත ලබා දී **2025.02.01** දින සිට අඛණ්ඩ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**එස්.ආලෝකබණ්ඩාර**
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | - කා.දැ.පි. |
| 02. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - කා.දැ.පි. |
| 03. ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | - කා.දැ.පි. |
| 04. ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | - කා.දැ.පි. |
| 05. ලේකම්, පරිසර අමාත්‍යාංශය | - කා.දැ.පි. |
| 06. පොලිස්පති, පොලිස් මූලස්ථානය | - කරු. පාරිසරික පොලිස් ඒකක දැනුවත් කිරීම සඳහා |
| 07. සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් | අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග අනුව සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණය කිරීම |
| 08. සියලුම සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් | |
| 09. සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් | |

ඇමුණුම - 1

# පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් විධිමත් කිරීම මඟින් චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහි ලා එම ආයතනවල වගකීම් ඉටු කිරීම පිළිබඳ මාසික වාර්තාව

පළාත :

දිස්ත්‍රික්කය :

පළාත් පාලන ආයතනයේ නම:

මාසය :

| දිනය | ක්‍රියාකාරකම | ස්ථානය | සහභාගීවූවන් සංඛ්‍යාව ( අදාළ වේ නම්) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිඵලය/ ප්‍රතිඵල | අපේක්ෂිත දිගු කාලීන ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

.................................　　.......................................　　................................

පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිලමුද්‍රාව

දිස්ත්‍රික්කය භාර සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අත්සන සහ නිලමුද්‍රාව

පළාත් පාලන කොමසාරිස්ගේ අත්සන සහ නිලමුද්‍රාව

දිනය : ....................　　දිනය :....................　　දිනය : ..................

ඇමුණුම -2

## පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් විධිමත් කිරීම මඟින් චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහි ලා එම ආයතනවල වගකීම් ඉටු කිරීම පිළිබඳ කාර්තුමය වාර්තාව

පළාත :

වාර්තා කරන කාලසීමාව:

| පළාත් පාලන ආයතනයේ නම | නියමිත කාලසීමාව තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | ස්ථාන ගණන | සහභාගීවූවන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රතිඵලය/ ප්‍රතිඵල | දිගු කාලීන අරමුණ |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

..............................

පළාත් පාලන කොමසාරිස්වරයාගේ
අත්සන සහ නිල මුද්‍රාව

දිනය :